# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/45 – 2022 අප්‍රේල් මස 27 වැනි බදාදා – 2022.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 577 වේරහැර උතුර, 578 කටුවාවල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, වේරහැර, කටුවාවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2016/393 හා 2016.08.08 දිනැති පූගමණ අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුතු ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අංක 01 - ප්‍රමාණය: හෙක්. 0.0964**

උතුරට: ජයන්ති ගුණසේකර සහ නිපුන් ගුණසේකර හිමිකම් කියන වරි. අංක 303 ඒ දරන ඉඩම, නිපුන් ගුණවර්ධන හිමිකම් කියන පිළියන්දල පාරේ වරි. අංක 202 ඒ දරන ඉඩම සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: පිළියන්දල පාර, ජයන්ති ගුණසේකර සහ නිපුන් ගුණසේකර හිමිකම් කියන වරි. අංක 303 ඒ දරන ඉඩම; බටහිරට: ජයන්ති ගුණසේකර සහ නිපුන් ගුණසේකර හිමිකම් කියන වරි. අංක 303 ඒ දරන ඉඩම.

**02. කැබලි අංක 02 - වරි. අංක 68 සී, පිළියන්දල පාර - ප්‍රමාණය: හෙක්. 0.0153**

උතුරට: ඇළ සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පිළියන්දල පාරේ වරි. අංකය සොයාගත නොහැකි ඩබ්ලිව්. අයි. ඒ. නානායක්කාර හිමිකම් කියන ඉඩම; බටහිරට: ඇළ.

**03. කැබලි අංක 03 - වරි. අංකය සොයාගත නොහැක, පිළියන්දල පාර - ප්‍රමාණය: හෙක්. 0.0171**

උතුරට: ඇළ, කැබලි අංක 2 සහ පිළියන්දල පාරේ වරි. අංකය සොයාගත නොහැකි ඩබ්ලිව්. අයි. ඒ. නානායක්කාර හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: වරි. අංකය සොයාගත නොහැකි ඩබ්ලිව්. අයි. ඒ. නානායක්කාර හිමිකම් කියන ඉඩම; දකුණට: වරි. අංකය සොයාගත නොහැකි ඩබ්ලිව්. අයි. ඒ. නානායක්කාර හිමිකම් කියන ඉඩම, පිළියන්දල පාර සහ ඇළ; බටහිරට: ඇළ.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2016/LRB/68.
2021 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 - 0206



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*